කුමාරි, ටී.ආර්. අග්‍රා දමයන්ති
ඉතිහාස අධ්‍යයන අංශය

*Paper: Diversity*

# පැරණි භාරතයේ වෙසඟනට හිමි වූ සමාජ තත්ත්වය

වෛශ්‍යා වෘත්තීය වූ කලී ලෝකයේ පැරණි ම වෘත්තියකි. සෙසු රටවලට වඩා භාරතීය සමාජය තුළ මෙම වෘත්තියට ඉහළ සමාජ තත්ත්වයක් හිමි වූ බව හින්දු ආගමික මූලාශ්‍රයන්ගෙන් මෙන් ම බෞද්ධ සාහිත්‍යයෙන් ද අනාවරණය වේ. සමාජීය වශයෙන් ගණිකාවට වරප්‍රසාද රැසක් හිමි වී ඇති අතර රටේ දේශපාලන ක්‍රියාවලිය තුළ ද ඇයට උසස් තත්ත්වයක් හිමි විය. භාරතීය සමාජයේ වෛශ්‍යාවගේ සමාජ, ආර්ථික හා දේශපාලන දායකත්වය පිළිබඳව විමර්ශනය කිරීම මෙම පර්යේෂණයේ මූලික අරමුණ විය.

රාජ්‍ය අනුග්‍රහය ලබමින් ඉතා විධිමත් ආකාරයෙන්, ගණිකා අධ්‍යක්ෂකවරුන්ගේ පාලනය යටතේ පවත්වාගෙන යනු ලැබූ ගණිකා වෘත්තිය, රජතුමා, රාජ කුමාරවරු ඇතුළු ප්‍රභූ පන්තියේ මෙන් ම තත්කාලීන සමාජයේ බොහෝ පුද්ගලයන්ගේ නොසංසිඳුණු කාමාශාව සංසිඳුවා ගැනීමට මහත් පිටුවහලක් වී ඇත. මෙම ගණිකාවන් අතර "අග්‍ර වෛශ්‍යාවන්" මෙන් ම ඉතා පහත් තත්ත්වයේ වීදි ගණිකාවෝ ද වූහ. අයකරනු ලබන මුදල් ප්‍රමාණය අනුව මෙන් ම පංචකල්‍යාණය අනුව ද ඔවුන්ගේ සමාජ තත්ත්වය එකිනෙකාට වෙනස් විය. ඒ පිළිබඳව දාර්ශනිකයන් මෙන් ම සාහිත්‍යධරයන් ද විවිධ අදහස් ඉදිරිපත්කර ඇත.

වත්මන් සමාජය තුළ ක්‍රියාත්මක වන ගණිකා වෘත්තිය බලවත් සමාජ ප්‍රශ්නයක් වී ඇති බව සත්‍යයකි. නමුත් අතීතයේ භාරතීය සමාජය තුළ ක්‍රියාත්මක වූ මෙම වෘත්තිය වඩාත් ශිෂ්ට සම්පන්න අයුරින් ක්‍රියාත්මක වූ බව පෙනේ. බොහෝදුරට භාරතීය කුලීන කාන්තාවන්ට හිමි නොවූ නිදහසක්, සමාජ තත්ත්වයක් වෛශ්‍යාවට හිමි විය. සාක්ෂරතාව මට්ටමින් ද ධනයෙන් ද සමාජ වරප්‍රසාද අතින් ද ඉහළ ස්ථානයක් ඇයට හිමි වී ඇත. ඔවුන්ට ම ආවේණික වූ කාමභෝගී ජීවන ක්‍රමයක් පැවති නමුත් මොවුන් හුදෙක් කම්සැප වෙනුවෙන් පමණක් ම වෙන් වූ පිරිසක් බව කිව නොහැකි ය. එනිසා ම තත්කාලීන සමාජය තුළ ගණිකාවන්ට හිමි සමාජ තත්ත්වය, ඔවුන්ගේ සේවා දායකත්වය හා රාජ්‍ය අනුග්‍රහය, සමාජ යෝග්‍යතාව ආදී කරුණු රැසක් මත ආදී භාරතීය වෙසඟනට ඉතා උසස් සමාජ තත්ත්වයක් හිමි වූ බව මෙමඟින් නිගමනය කළ හැකි ය.

**මූලික පද: වෛශ්‍යාව, අග්‍ර වෛශ්‍යාව, ගණිකා අධ්‍යක්ෂක, සමාජ තත්ත්වය**